# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.12.10 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් පස්වන (45) සභා වාරය 2021.12.10 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයසීලන් මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණී මැතිතුමිය |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

**නොපැමිණීම**

| | | |
|---|---|---|
| 01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි. එහිදී සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පසු ගිය මස මහ සභා වාර්තාව කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ සහ තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාවේ ඒකමතික එකඟතාවයෙන් සභා සම්මත කරන ලදි.

## 02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත

## 03.සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම.

අසනීප තත්ත්වයක් හේතුවෙන් අද දින මහ සභා වාරයට සහභාගී වීමට නොහැකි බව පවසා වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් දැනුම් දීමක් කර ඇති බවත්, ක්‍රිශාන්ත රත්නායක මන්ත්‍රීතුමන් සහ රංජිත් රත්නායක මන්ත්‍රීතුමන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් පැවැත්වෙන පුහුණු වැඩමුලුවකට අද දින සහභාගී වන බවත්,ඒ වගේම සන්ධ්‍යා අනුරුද්ධිකා මන්ත්‍රීතුමිය කොරෝනා රෝගය වැළදී තවමත් නිරෝධායන කාලය අවසන් නොමැති බවත් ගරු සභාපතිතුමන් සභාවට දැනුම් දෙන ලදි.

එම නිවාඩු පිළිගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව අනුමත කර සිටින ලදි.

## 04. යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම

නැත

## 05. යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

### 05.01 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

මොනරාගල වැදිකුඹුර පාර අංක 34/2 හී පදිංචි ඒ.එම්.සෝමසිරි මහතා විසින් එම ස්ථානයේ පදංචි පවුල් 4 ක පමණ ජීවත්වන්නන් සඳහා ගමන් කිරීමට ඇති මාර්ගය පවතින වැසි සමයත් සමඟ දැඩි සෝදා පාලුවකට ලක්ව වලවල් හැරී ගමන් කිරීමට අපහසු තත්ත්වයක් ගෙන දී ඇති නිසා මෙම මාර්ගය සකස් කර දීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු අතර, 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන වලට යටත්ව මෙම සංවර්ධන කටයුත්ත ඉදිරි වර්ෂයේදී සිදු කිරීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.ඒ සඳහා මහ සභාවේ ඒකමතික එකඟතාවය ද ලබා දෙන ලදි.

**යෝජනා අංක 02**

මොනරාගල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඇතිව නව බස් නැවතුම්පොල ගහ බඩ අංක 11 කඩකාමරයට යාබදව පසුව ඉදිකරගන්නා ලද අංක 12 ලෙස හඳුන්වනු ලබන වී.ජී.චමින්ද ප්‍රියදර්ශන යන අය විසින් දීර්ඝ කාලයක් පවත්වාගෙන යනු ලබන කඩ කාමරය සඳහා ගිවිසුමකට යටත්ව එහි පවත්වාගෙන යනු ලබන අනෙකුත් කඩවලින් අය කරන මුදල පදනම් කර ගනිමින් මාසිකව රු.6200.00 ක බදු මුදලක් සභාවට ගෙවීම සඳහා අවසර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා  සභා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී මෙම යෝජනාවත් සමඟම මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පල පොදු වැසිකිළිය, නව පොළ භූමියේ පොදු වැසිකිළිය සහ බිබිල පාර නව ක්‍රීඩා ගාරයේ උඩු මහල යන දේපළ ද 2022 වර්ෂයට අදාලව වාර තුනකදී ම ටෙන්ඩර් කළද අවස්තා තුනේදීම කිසිවෙකු ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීමට ඉදිරිපත් වී නොමැති අතර සභාව සතු යම් දේපලක් තුන් වතාවක් ටෙන්ඩර් කර අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවන් වලදී ඒ සඳහා කැමැත්තෙන් ඉදිරිපත් වන ඉල්ලුම් කරුවෙකු හට සභා තීරණයකින් එවැනි දේපලක් බදු ගෙන කටයුතු කිරීමට ලබා දිය හැකි අතර, නමුත් වර්තමානයේදී මෙසේ යම් දේපලක් ටෙන්ඩර් නොයන අවස්ථා පැමිණෙන තුරු බලන් සිටින අවස්තාවාදී පිරිසකුත් සිටින අතර ඔවුන්ගේ අරමුණ වන්නේ එවැනි දේපල සඳහා ටෙන්ඩර් ඉල්ලුම් කරුවෙකු ලෙස ඉදිරිපත් නොවී පසුව අඩු මුදලකට ලබා ගැනීමට ඉල්ලුම් කරන බැවින් එවැනි අයවලුන්ට ඉඩ ලබා දිය නොහැකි බැවින් මේ සඳහා ඉදිරි කටයුතු කිරීම සම්බන්ධයෙන් අද දිනම සභා තීරණයක් ගත යුතු බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාවන් දෙක  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාවට අනුව වී.ජී.චමින්ද ප්‍රියදර්ශන යන අය විසින් දීර්ඝ කාලයක් තුළ පවත්වාගෙන යනු ලබන බස් නැවතුම්පොල ගහ බඩ අංක 12 කඩ කාමරය සඳහා ඔහුගේ ඉල්ලීමට අනුව ගිවිසුමකට යටත්ව රු.6200.00 ක මාසික බදු මුදලක් සභාවට ගෙවීමේ පදනම මත 2022 වර්ෂයේ සිට ඉදිරියට පවත්වාගෙන යාමට මෙම ඉල්ලුම් කරුට අවස්ථාව ලබා දීම  සුදුසු බවත්, එසේම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද සභාව සතු පොදු වැසිකිළි දෙකත්, බිබිල පාර නව ක්‍රීඩා ගාරයේ උඩු මහලත් තෙවන වර ටෙන්ඩර් කරන ලද ලංසු මුදලින් 10% ක් අඩු කර ප්‍රාදේශීය මට්ටමින් පමණක් හතර වෙනි වතාටත් ටෙන්ඩර් ප්‍රසිද්ද කිරීමක් සිදු කර බදු දීම සුදුසු බවට  මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

මොනරාගල රෝහල් පටුමඟ කලුලන්දයාය ලිපිනයේ පදිංචි ආර්.එම්. කරුණාවතී යන අය විසින් ඒ අසල ම පදිංචි ඩබ්.එම්.සෙනෙවිරත්න විජේසිංහ යන අයට විරුද්ධව ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් මොනරාගල පොලිසියේ විවිධ පැමිණිලි අංශය වෙත පැමිණිල්ලක් ගොනු කර ඇති බවත්, අනතුරුව දෙපාර්ශවය ගෙන්වා කරුණු විමසීම් කිරීමේදී වග උත්තර කාර පාර්ශවයට ඉඩම්

ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් ඔප්පු අංක 4733 දරණ ඔප්පුවක් 2011.11.25 වන දින නිකුත් කර අක්කර 01 යි රූඩ් 03යි පර්චස් 4.28 ක් ඇති බව සඳහන් කර ඇති අතර පැමිණිලි පාර්ෂවය වන ආර්.එම්. කරුණාවතී යන අය මෙම කොටසට කිසිඳු බලපත්‍රයක් හෝ ලේඛණයක් ඉදිරිපත් නොකරන බවත් ඇය මෙම ඉඩමේ පරුවස් 05 ක පමණ කොටසක් සඳහා අයතිවාසිකම් ඉල්ලනු ලබන අතර අදාල ඉඩමෙන් මොනරාගල ප්‍රාදේශය සභාව මගින් මාර්ගයක් ප්‍රතිසංස්කරණය කර ඇති බවත්, එම නිසා මෙම ආරවුල ඇති වූ බවත්, දෙපාර්ෂවයම පිළිගන්නා අතර මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් කර එම පැමිණිලි කරුවන් සඳහා ස්ථිර විසඳුමක් ලබා දෙන ලෙස පොලිස් ස්ථානාධිපතිතුමන් විසින් කර ඇති දැනුම් දීම සම්බන්ධයෙන් මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

සිරිගල රෝහල පිටුපස ප්‍රාදේශීය සභාවට අයත් පැරණි මාර්ගයක් තිබූ අතර එම ස්ථානයේ පදිංචි කරුවෙකු විසින් මෙම මාර්ගයටත් ඔහුගේ ඉඩමෙන් ලබා දී ඇති මාර්ගයටත් මැදිවී ඇති ඔහුට අයත් බිම් කොටසක් ඔප්පු සහිතව විකුණා ඇති අතර, මෙසේ මිල දී ගත් අය විසින් යම් යම් ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට යන බැවින් එසේ යම් ඉදිකිරීම් සිදු කළොත් මෙම මාර්ගයේ රක්ෂිත කොටසට ගැටලුවක් වන බවත්, එසේ ඉදිකිරීම් කිරීමට මෙහි ප්‍රමාණවත් ඉඩක් නොමැති බැවින්, අවට ප්‍රදේශවාසීන්ද මෙම ඉදිකිරීම් සඳහා විරුද්ධත්වය එල කර ඇති බවත් ගරු සභාපතිතුමන් සභාවට ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් නැවත සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර මෙම ඉඩම් කොටස මිල දී ගත් අය විසින් සිදු කිරීමට නියමිත ඉදිකිරීම් සඳහා ප්‍රදේශවාසීන් විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද ලිඛිත ලිපි ලේඛන තිබේද යන්න අජිත් අගලකඩ ගරු මන්ත්‍රීතුමන් විසින් විමසා සිටියදී එසේ ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කරන ලද ලිපි ඇති බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.වෙනත් අදහස් හා විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

දැනට මෙම අතුරු මාර්ගයේ පූර්ව අවසරයකින් තොරව මාර්ග රක්ෂිතය අවහිර වන අයුරින් කිසිඳු ඉදිකිරීමක් හෝ වගා කටයුත්තක් සිදු නොකරන ලෙසටත්, දැනට අවසරයකින් තොරව සිදු කර ඇති සියලු ඉදිකිරීම් නතර කිරීමට හා ඉවත් කර ගැනීමට අදාල පාර්ෂවයන් වෙත සභා තීරණ දැනුම් දීමට පියවර ගත යුතු බවටත් සභාව තීරණය කරන ලද අතර මෙම තීරණයන් දැනුම් දීමෙන් අනතුරුව එය නොසලකා හැර කටයුතු කරන අය වලුන් සිටිනම් ඔවුන්ට විරුද්ධව (නීතිමය වශයෙන් හෝ) ඉදිරි පියවර ගන්නා බවද සභාවේ තීරණය කළ බව ඔවුන් වෙත දැනුම් දීම සුදුසු බවටත්, ඒ වගේම මෙහි නිරවුල්භාවය සම්බන්ධව කාර්මික නිලධාරී මගින් කරුණු කාරණා තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම රක්ෂිතය ප්‍රාදේශීය සභාව විසින් විධිමත් කටයුත්තක් වෙනුවෙන් යොදවා ගැනීමට පියවර ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 04**

මොනරාගල ප්‍රාදේශීය සභාව විසින් දෛනිකව එකතු කරන කසළ බැහැර කරන ස්ථානයේ ගොඩගැසී ඇති කසළ සඳහා වලවල් සකස් කර බැහැර කිරීමටත් අලුතින් එකතුවන කසළ බැහැර කිරීමටත් , ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමටත් වලවල් හා කාණු කපා සකස් කිරීම සඳහා PC200 වර්ගයේ එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත යොදවා ගැනීමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙසේ අවසන් කසළ බැහැර කරන ස්ථානයේ දෛනිකව එකතු වන හා මේ වන විට ගොඩගැසී ඇති කසළ සඳහා වලවල් සකස් කර බැහැර කිරීමටත් , අලුතින් එකතුවන කසළ බැහැර කිරීමටත් , ගලි අපද්‍රව්‍ය බැහැර කිරීමටත් , වලවල් හා කාණු කපා විධිමත්ව සකස් කිරීම සඳහා PC200 වර්ගයේ එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලී පදනම මත යොදවා ගැනීමටත් විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව එම අදාල කටයුතු සිදු කර සභා අරමුදලෙන් අදාල ගෙවීම් කටයුතු සිදු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**

මොනරාගල දොඩම්වත්ත විමලසිරි ස්ටෝර්ස් අසලින් වැටකේආර ගමට යන මාර්ගයේ විශාල මඩවලක් සැදී ගමනා ගමනයට ඉතා අපහසු තත්ත්වයක් ගෙන දී ඇති බැවින් එම මඩ වල පිරවීම සඳහා සභාව මගින් ABC කියුබ් දෙකක් ලබා දීමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට රමණී රත්නායක ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කාර්මික නිලධාරී මහතා යොදවා මෙම තත්ත්වය සම්බන්ධව සොයා බලා නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරු විධිමත් ක්‍රම වේදයන්ට යටත්ව මේ සඳහා අවශ්‍ය ABC කියුබ් දෙක සභා අරමුදලෙන් ලබා දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 06**

කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් පළාත් පාලන ආයතනවල ගරු මහජන නියෝජිතයින් සම්බන්ධ කරගෙන සහනා ආහාර ද්‍රව්‍ය ලබාදීම සඳහා රජය විසින් ලබා දෙන ලද අනුමැතියට අනුව මොනරාගල ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් විසින් සභා අරමුදලින් රු.250,000/- බැගින් (සභා අනුමැතියකට යටත්ව) අත්තිකාරම් මුදලක් ලබා ගනිමින් (මාස 03ක් ඇතුලත නැවත පියවීමේ පදනම මත) අසරණ වූ ජනතාව වෙනුවෙන් සහන බඩු මළු බෙදා දීම සිදු කරන ලද අතර එම කටයුතු සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව අදාල මාස තුන ඇතුලත ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් පමණක් මෙසේ ලබා ගත් මුදල් පියවා නිම කර ඇති අතර ඉතිරි මන්ත්‍රීවරුන් හිඟ අත්තිකාරම් මුදල් නොපියවීම සම්බන්ධව ගරු මහ සභාවේ අවස්ථා කිහිපයකදීම සාකච්ඡාවට බඳුන් කල අවස්ථාවන් වලදී අදාල මන්ත්‍රීවරුන් විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව සාධාරන කාලයක් මෙම හිඟ මුදල් පියවීම සඳහා ලබා දෙන ලදී. එහෙත් පොරොන්දු වූ ආකාරයට එම කටයුතු සිදු නොවූ අතර මෙම මුදල් ගෙවා අවසන් කිරීමට ලබා දී ඇති කාලය ද ඉක්මවා ගොස් මේ වන විට වසර 2ක් පමණ ඉක්ම ගොස් ඇති අතර, මෙතෙක් අදාල මන්ත්‍රීවරුන් විසින් මෙම හිඟ මුදල පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර එසේ මුදල් ගෙවීමට ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මෙම මුදල ලබා ගැනීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් ගරු සභාවේ තීරණය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| | | |
|---|---|---|
| 01. ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ආර්.උපුල් මයා | - | රු.250,000.00 |
| 02. ප්‍රාදේශීය සභා මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා | - | රු.250,000.00 |
| 03. ප්‍රාදේශීය සභා මන්ත්‍රී චාමර නානායක්කාර මහතා | - | රු.150,000.00 |
| 04. ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනත් ගුණවර්ධන මහතා | - | රු.100,000.00 |

එම යෝජනාව සුදුසු බවට පී.බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

විගණන අධිකාරී විසින් මේ සම්බන්ධයෙන් නිතර විමසීම් කරන අතර මෙම මුදල් පියවීම සඳහා දිර්ඝ කාලයක්ද ගතව ඇති අතර ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම සකස් කිරීමේදී අද වන තුරු මෙවැනි ගැටලුකාරී තත්ත්වයන් ඇති වීම වලක්වා ගනිමින් අවසන් ගිණුම හොඳින් පවත්වාගෙන ගිය අතර මෙම වර්ෂයේ අවසන් ගිණුමට මෙය ගැටලුවක් වීමට ඉඩ නොදිය යුතු බැවින් මෙම මස 15 වන දිනට පෙර අනිවාර්යයෙන්ම මෙම හිඟ මුදල් ගෙවා අවසන් කළ යුතු බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

මෙම තත්ත්වය සභාවට වැරදි පූර්වාදර්ශයක් ගෙන දෙන්නක් වන අතර ඉදිරියේදී වුවද මෙවැනි අවස්ථාවකදී අත්තිකාරම් ලබා දීම් වලදී දෙවතාවක් සිතා බැලීමට සිදු වන තරමට මෙම අවස්ථාවේදීම විශ්වාසය පලුදු වී ඇති අතර කෙසේ වෙතත් මෙම වර්ෂය අවසන් වීමට පෙර මෙම හිඟ මුදල් ගෙවීම අනිවාර්යයෙන්ම කළ යුතු බව සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

මෙම අදහස් ප්‍රකාශ කිරීම් හමුවේ ඉදිරිපත් වූ කරුණු කාරණා සාධාරණ වන අතර තව දුරටත් මෙහි ගැටලුසහගත තත්ත්වයක් ඇති නොකර ගනිමින් 2021 වර්ෂයේ ගිණුම් පියවීමට පෙර මෙම හිඟ මුදල් ගෙවා අවසන් කළ යුතු බව තමන් ඇතුළු පිරිස විසින් පිළිගන්නා අතර මෙම මස 20 දිනට පෙර මෙම මුදල් පියවා අවසන් කිරීමට කටයුතු කරන බවත්, අද දින සභාවට නොපැමිණි අදාල මන්ත්‍රීවරුන්ද මේ සම්බන්ධයෙන් දැනුවත් කරන බවටත්, චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමන් විසින් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙසේ සාකච්ඡා කර ගත් පරිදි ප්‍රාදේශීය සභා 2021 වර්ෂයේ අවසන් ගිණුම පියවීමට පෙර මෙම මස 20 දිනට ප්‍රථම මෙම හිඟ මුදල් පියවා අවසන් කිරීමට අදාල මන්ත්‍රීවරුන් විසින් කටයුතු කළ යුතු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

මොනරාගල බල ප්‍රදේශය තුල පහත සඳහන් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සභා අරමුදලින් සිදු කිරීම සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

1. මොනරාගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ විවෘත පොලිකාබනේට් වහලය දිරාපත්ව ඇති බැවින්, එම වහලය නැවත සකස් කිරීම
2. පොතුවිල් පාර සෙත්සිරි මාවතේ 4 වනපටුමග (වෙලගෙදර මාර්ගය) ග්‍රැවල් යොදා සකස් කිරීම.
3. බටුගම්මන ආගරේ මාර්ගය කොටසක් ග්‍රැවල් යොදා සකස් කිරීම.
4. බටුගම්මන වෙල්යායට යන මාර්ගය කොන්ක්‍රීට් හියුම් පයිප්ප 2ක් ලබා දීම.
5. සිරිගල රෝහල ඉදිරිපිට අතුරු මාර්ගයට ABC කියුබ් 2 ½ ක් සපයා දීම. (වෛද්‍ය සුගත් මහතාගේ නිවස මාර්ගය)
6. වැලියාය පෙරපාසල වැඩි දියුණු කිරීමට අවශ්‍ය වැට, වහලය ඇතුලුව අනෙකුත් අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම.
7. ජයසෙන්ගම මදුරුකැටිය පැරණි සුසාන භූමියේ අතුරන ලද කොම්පෝස්ට් පස් වැසීම සඳහා පස් මිලට ගැනීමටත්, එම පස් තලා අතුරා එම භූමිය උද්‍යානයක් ලෙස සකස් කිරීමට අවශ්‍ය සියලු කටයුතු සභා අරමුදලින් සිදු කිරීම.
8. ආදාහනාගාරයට අයත් මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම.
9. මොනරාගල ප්‍රජාශාලාවට අයත් ඉඩම වටා කම්බි වැට ගැසීම.
10. ආදාහනාගාරය වටේ බිම සකස් කිරීම.
11. විගණන අධිකාරී කාර්යාලයේ සංචාරක නිවාසය සහ විගණන පරීක්ෂක නිවාස වල බිම ඇතුළු දොර ජනෙල් වල තීන්ත ආලේප කිරීම ඇතුළු හඳුනාගත් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම. (ජාතික විගණන කාර්යාලීය ප්‍රතිපාදන මත)
12. මොනරාගල නගරයේ පොලිස් මුරපොළ ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම.
13. නගරයේ පවතින ප්‍රාදේශීය සභා ජල නළ පද්ධති සකස් කිරීම සහ අලුත්වැඩියා කිරීම.
14. මොනරාගල ප්‍රාදේශීය සභා පුස්තකාලයේ ජල නළ පද්ධති අලුත්වැඩියා කර ජල ටැංකියක් ස්ථාපිත කිරීම, ගිණිබට සේවකයින් සිටින ගොඩනැගිල්ල ඇතුළුව පුස්තකාල ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීම , තීන්ත ආලේප කිරීම, හා අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
15. ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ ජල නළ පද්ධති අලුත්වැඩියා කිරීම.
16. සිරිගල ලයිම පාර මීටර් 40ක් කොන්ක්‍රීට් කර සකස් කර දීම.
17. හුලංදාව දකුණ වැටකෙයියාආර මාර්ගයට ABC දමා සකස් කිරීම.
18. ප්‍රාදේශීය සභා ජීලෝන් ජල ව්‍යාපෘතිය සඳහා ජල ටැංකියක් තබා අවශ්‍යාකාරයට සකස් කර දීම.

19. ප්‍රාදේශීය සභා කුඹුක්කන පුස්තකාලයට ජල ටැංකියක් තබා අවශ්‍යාකාරයට සකස් කර දීම.
20. නව පොදු වෙළඳපොලේ උඩු මහලේ ජලය රැඳෙන ස්ථාන සඳහා ABC කියුබ් 3ක් දමා සකස් කිරීම.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව මෙම සංවර්ධන කටයුතු සඳහා විශාල මුදලක් වැය නොවන අතර මන්ත්‍රීවරුන් විසින් සභාවේ විටින් විට සාකච්ඡා කළ හා අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු කිහිපයක් සභාවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර මෙසේ සභාවට ඉදිරිපත් කළ අතර මෙම යෝජනාවට ඇතුලත් මාර්ගවලද ගමන් කිරීමට අපහසු වලවල් හෑරී ඇති ස්ථාන සහ අනතුරුදායක ස්ථාන පමණක් සකස් කිරීමට සූදානම් වන බවත්, කෙසේ වෙතත් ලබන වර්ෂයේ සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන වලින් ප්‍රදේශයේ අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සියල්ලම සිදු කිරීමට හැකිවන බවටත්, ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
ආයතනයේ කාර්මික නිලධාරී මහත්වරුන්ගේ නිසි අධීක්ෂණය යටතේ අදාල නිර්දේශ වාර්තාවන් හා ඇස්තමේන්තු ප්‍රකාරව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදල් යටතේ මෙම සංවර්ධන කටයුතු නිසි පරිදි විධිමත්ව සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 08**

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට කුඹුරු ඉඩම් හිමිකරුවන් විසින් ගෙවන ලද අක්කර බදු ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් මීට පෙර මහ සභාව විසින් ලබා දුන් සභා තීරණය පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කිරීමෙන් අනතුරුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට මෙම අක්කර බදු ගෙවනු ලැබුවත් අදාල කුඹුරු ඉඩම් හිමියන්ගෙන්ම වරිපනම් බදු ප්‍රාදේශීය සභාව විසින් අය කර ගත යුතු බවට උපදෙස් ලබා දී ඇති බැවින්, මෙම හිඟ වරිපනම් බදු අය කර ගැනීම සම්බන්ධව මහ සභාවේ තීරණය සහ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයපීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව 2021.08.24 දින මහ සභාවේදී මේ සම්බන්ධයෙන් ගත් සභා තීරණය ගරු ආණ්ඩුකාර තුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ අවස්ථාවේදී පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කිරීමෙන් අනතුරුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අක්කර බදු අය කර ගනු ලැබුවත් ඔවුන්ගෙන් අය කර ගත යුතු වරිපනම් බදු මුදල් ප්‍රාදේශීය සභාව මගින් අය කළ යුතු බැවින් මේ වන විට මෙම බදුකරුවන්ට අයත් හිඟ වරිපනම් බදු මුදල වන රු.407,841.68 ක මුදල ප්‍රාදේශීය සභාවට අය කර ගන්නා ලෙස අප වෙත දැනුම් දී ඇති බව ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හා එම ඉඩම් භුක්ති විඳින අයිතිකරුවන් නිශ්චිතව හඳුනාගෙන ආදායම් පරීක්ෂක වරුන් මගින් මෙලෙස අය කර ගත යුතු හිඟ වරිපනම් බදු ගාස්තු අය කර ගැනීමටත්, ඉන් ඉදිරියට මෙම බදු කරුවන්ට අදාල වරිපනම් බදු මුදල් විධිමත්ව අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 09**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම, සේවා කටයුතු සිදු කිරීම, අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් අදාළ කටයුතු කිරීමටත්, ඒ සඳහා වැය වූ මුදල් සභා අරමුදලෙන් වියදම් දැරීමටත් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| | | |
|---|---|---|
| i. | PF – 7419 කැබ් රථයේ වාරසේවා සිදු කිරිම | රු. 20,990.00 |
| ii. | PF – 7419 කැබ් රථයේ වයිපර් බ්ලේඩ් 02 මිලදී ගැනීම | රු. 2,900.00 |
| iii. | 252-6330 කැබ් රථය වාර සේවා සිදු කිරීම | රු. 21,440.00 |
| iv. | ZA – 5061 බැකෝ ලෝඩරය සඳහා ට්‍රාන්ස්මිෂන් ඔයිල් ලී.4ක් මිලදී ගැනීම | රු. 4,800.00 |
| v. | ZA – 5061 බැකෝ ලෝඩරයට ඔයිල් සීල් කට්ටලයක් මිලදී ගැනීම | රු. 16,158.75 |
| vi. | LL – 7682 කෘෂ කැබ් රථයේ මාස්ටර් පොම්පය අළුත්වැඩියා කිරීම | රු. 2,050.00 |
| vii. | LL – 7682 කෘෂ කැබ් රථයේ කලච් එකෙහි උඩ හා යට පොම්ප මිලදී ගැනීම | රු. 16,795.45 |
| viii. | LL – 6980 ටිපර් රථය සඳහා ක්ලච් ප්ලේට් සහ ෆ්‍රයිවීල් අළුත්වැඩියා කිරීම | රු. 22,100.00 |
| ix. | RC – 1112 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටියේ රේසර් යෙදීම ස<br>හ වම්පස ලොකු රෝදයේ ඩිස්ක් එක අළුත්වැඩියා කිරීම. | රු. 14,800.00 |
| x. | RC – 1112 ට්‍රැක්ටර් රථයේ ගියර් පෙට්ටියේ අළුත්වැඩියා සිදු කිරීම<br>(වොෂ්, සාෆ්ට් එක, රිවස් ගියර් එක, පිත්තල බ්‍රෂ්, ලියවා සකස් කිරීම) | රු. 23,800.00 |
| xi. | 49-5301 ට්‍රැක්ටර් රථයේ 600x16 CEAT ටයර් 02ක් යොදා ගැනීම | රු. 34,500.00 |
| xii. | 37-9430 ට්‍රැක්ටර් රථය සඳහා 95DBIR බැටරි 01ක් මිලදී ගැනීම | රු. 23,800.00 |
| xiii. | 37-9430 ට්‍රැක්ටර් රථයේ බෙයාරින් ගැනීමට උපකරණ මිලදී ගැනීම | රු. 17,950.00 |
| xiv. | 37-9430 ට්‍රැක්ටර් රථයේ බෙයාරින් ගැනීමට උපකරණ මිලදී ගැනීම | රු. 14,080.00 |
| xv. | 37-9430 ට්‍රැක්ටර් රථයේ බෙයාරින් ගැනීමට උපකරණ මිලදී ගැනීම | රු. 2,860.00 |
| xvi. | 37-9430 ට්‍රැක්ටර් රථයේ බෙයාරින් දැමීම සඳහා වැඩ කුලිය | රු. 32,600.00 |

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නිසි ක්‍රම වේදයන්ට යටත්ව අදාල පරීක්ෂණ වාර්තා, නිර්දේශ කිරීම් හා අදාල අනුමැතීන්ට යටත්ව මෙම අලුත්වැඩියා කටයුතු, සේවා කටයුතු හා අමතර කොටස් මිල දී ගැනීම් විධිමත්ව සිදු කර අදාල ගෙවීම් කටයුතු සහා අරමුදලින් විදිමත්ව ගෙවීම් කිරිම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 10**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තක්සේරු නොකළ ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා 2021.12.21 හා 22 යන දිනයන් වල වෙනත් ආයතන කිහිපයක ආදායම් පරීක්ෂකවරුන් කිහිපදෙනෙකු පැමිණීමට නියමිතව ඇති බැවින් ඔවුන් සඳහා ආහාරපාන ලබා දීම සහ අවශ්‍ය අනෙකුත් වියදම් සඳහා සභා අරමුදලෙන් වියදම් දැරීමටත් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම නව තක්සේරු කටයුතු කටයුතු නිවරදිව සිදු කර ඒ සඳහා සහභාගී වන කණ්ඩායම සඳහා අදාල වියදම් සහ දීමනාවන් සඳහා නිසි ක්‍රම වේදයන්ට යටත්ව සභා අරමුදලින් වියදම් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 11**

2021 වර්ෂයේ දෙසැම්බර් මාසයට ආයතනය සඳහා මිලදී ගනු ලැබූ පහත සඳහන් අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහා මහ සභාවේ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සඳහා වැහි කබා මිල දී ගැනීම | රු. | 271,100.00 |
| 2. | ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් සිලින්ඩර් නැවත පිරවීම සඳහා | රු. | 1,947,300.00 |
| 3. | වැලියාය පුස්තකාලය සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම | රු. | 35,980.00 |
| 4. | විදුලි අංශය සඳහා අවශ්‍ය උපකරණ මිල දී ගැනීම | රු. | 177,475.00 |
| 5. | ආදාහනාගාරයට අවශ්‍ය ගෑස් සිලින්ඩර් නැවත පිරවීම සඳහා | රු. | 41,150.00 |
| 6. | ගිණි නිවීමේ උපකරණ මිලදී ගැනීම සහ නැවත පිරවීම | රු. | 186,100.00 |
| 7. | තාක්ෂණික අංශය සඳහා ලැප්ටොප් පරිගණකයක් හා මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම | රු. | 159,000.00 |
| 8. | උසාවිය අසල ගිමන් ස්ථානයක් සඳහා බංකු ලබා ගැනීම | රු. | 67,500.00 |
| 9. | උද්‍යාන අලංකරණයට බංකු ලබා ගැනීම | රු. | 13,000.00 |
| 10. | මාර්ග අංශය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම | රු. | 32,125.00 |

මෙහි අනු අංක 2 යටතේ ඇති අයිතමය සඳහා සඳහන් කර ඇති මිල රු. 1,947,300.00 ක මුදල වැරදියට මුද්‍රණය වී ඇති බැවින් එම මුදල රු.194,730.00 ක් ලෙසට නිවරදි විය යුතු බවට ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

එම සංශෝධනයත් සමඟ මෙම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ආයතනයට අත්‍යාවශ්‍ය මෙම මිල දී ගැනීම්වලට අදාල උපකරණ හා භාණ්ඩ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව මිලදී ගැනීමටත්, ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවටත් ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### යෝජනා අංක 12

දොඩම්වත්ත අළුත් මාවත දිසානායක මහතාගේ නිවස අසල මාර්ගයේ කාණුව හා පැතිබැම්ම සකස් කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉදිරි කාලය තුළ සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන මුදල් වලින් මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකියාව පවතින බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටි අතර ඒ අනුව මෙම සංවර්ධන කටයුත්තද ලබන වර්ෂයේ ලැබෙන ප්‍රතිපාදන වලින් සිදු කරමු යන්න මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මොනරාගල රත්තනපිටිය සිහිති පෙර පාසලේ දරුවන්ගේ ක්‍රියාකාරකම් සඳහා ස්ථිර සෙල්ලම් ගෙයක් සෑදීමට දෙමාපියන්ගේ දායකත්වයෙන් සූදානම් කර ඇති අතර, මේ සඳහා වහලය සකස් කර ගැනීමට අඩි 6ක් දිග සෙවිලි ෂීට් 10ක් සහ මුදුන් උළු කැට 14ක් ලබා දීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් මහ සභාව වෙත ඉදිරිපත් කර තිබූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී

ප්‍රාදේශීය සභා කටයුතු වලට අදාලව මෙම පෙර පාසලේ දරුවන් වෙනුවෙන් ඉල්ලුම් කර ඇති අඩි 6ක් දිග සෙවිලි ෂීට් 10ක් සහ මුදුන් උළු කැට 14ක් කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශ යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

### යෝජනා අංක 02

මොනරාගල සමගි මාවතහි පදිංචි ප්‍රතිලාභී පවුල් 06ක් භාවිතයට ගන්නා සමගි මාවත මාර්ගයේ අවසාන කොටස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර දීම සඳහා මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ක්‍රිශාන්ත රත්නායක මහතා විසින් මහ සභාව වෙත කර තිබූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කර සිටින ලදි.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී

ඉදිරි කාලය තුළ සභාවට ලැබීමට නියමිත ප්‍රතිපාදන වලින් මෙම සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකියාව පවතින බවට ගරු සභාපතිතුමන් සඳහන් කර සිටි අතර ඒ අනුව මෙම සංවර්ධන කටයුත්තද ලබන වර්ෂයේ ලැබෙන ප්‍රතිපාදන වලින් සිදු කරමු යන්න මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 5.3 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩබ්.එම්.පී.බණ්ඩාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

බටුගම්මන ග්‍රාම සේවා වසමේ අරාව කුඹුරුයාය සඳහා ජලය ලබා ගන්නා අතුරු ඇල මාර්ගය වසර ගණනාවක සිට අබලන් තත්ත්වයේ පවතින බැවින්, මේ සඳහා අඟල් 6 ප්‍රමාණයේ විශ්කම්භයෙන් යුත් හියුම් පයිප්ප 02ක් ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී පී.බණ්ඩාර මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී

මෙම ඉල්ලුම් කර ඇති හියුම් පයිප්ප 02ක කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සහා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 5.4 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මො/වෙහෙරගල ප්‍රාථමික විදුහලට පසුගිය දිනක ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා පැමිණි අවස්ථාවේදී ගරු සභාපතිතුමන් විසින් ලබා දුන් උපදෙස් හා එකඟතාවය මත එම විදුහලේ පානිය ජල අවශ්‍යතාවය සඳහා වෙහෙරගල පන්සල අසල සිට තෙලබෝගල හංදිය දක්වා කි.මී.2ක් පමණ ජල නල පද්ධතිය දීර්ඝ කිරීම සඳහා කාණු කපා ජල සම්පාදන මණ්ඩලයෙන් ජල නල ලබාදීම සඳහාත් සහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී කේ.එම්.ගුණවර්ධන මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් විජේරත්න ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභාවේ යන්ත්‍ර සූත්‍ර යොදා මෙම විදුහලට අවශ්‍ය පානීය ජලය ලබා දීමට අවශ්‍ය කාණු පද්ධතිය කපා සකස් කර ඊට අදාල අත්‍යාවශ්‍ය අනෙකුත් කටයුතු ද සභා අරමුදලින්ඉටු කර දීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 5.5 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

### යෝජනා අංක 01

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ විසින් ජනතාවගේ යහපැවැත්ම ආර්ථිකය සහ සමාජීය දියුණුව අරමුණු කර ගනිමින් දුම් කොළ සහ මධ්‍යසාර පාලනය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස 2006 අංක 27 දරණ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනතට යෝජිත සංශෝධන (ඇමුණුම 01) ගෙන ඒමටත් තනි සිගරට් අලෙවිය තහනම් කිරීමටත්, දුම්කොළ වගාව තහනම් කිරීමටත් අවශ්‍ය නීති සම්මත කර ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී සුනිල් අරංගල මන්ත්‍රීතුමන් විසින් මේ සම්බන්ධයෙන් තවදුරටත් සභාවට පැහැදිලි කිරීමක් කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉන් අනතුරුව මෙය කාලෝචිත වශයෙන් ඉතාමත් වටිනා සහ වැදගත් යෝජනාවක් වන අතර මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ විසින් ජනතාවගේ යහපැවැත්ම ආර්ථිකය සහ සමාජීය දියුණුව අරමුණු කර ගනිමින් ගෙන ඇති මෙම ක්‍රියාමාර්ගයන්ට අනුව අවශ්‍ය නීති සම්මත කර ක්‍රියාත්මක කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට එදින පැමිණ සිටි සියලු සභිකවරුන් විසින් එකඟතාවය ලබා දෙන ලදි.

- **කල් දී නොමැති හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතිය ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා සභාවට ප්‍රකාශ කළ අතර, ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක් නොමැතිව එකඟතාවය එල කර සිටි බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

I. මොණරාගල ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය වැඩි දියුණු කිරීම යටතේ ප්‍රතිචක්‍රීයකරණය කල හැකි ද්‍රව්‍ය සඳහා ගබඩාවක් ඉදිකිරීම, පොහොර ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා කොන්ක්‍රීට් ආස්තරයක් දැමීම යන කාර්යයන් සඳහා පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.1761510.95 ක මුදලක් වෙන් කර ඇති බව 2021 අගෝස්තු මස 24 වන දින ලිඛිතව අප වෙත දැනුම් දී ඇති අතර,මේ සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවට අදාලව BSR මිල ගණන්වල වටිනාකම 2021 වර්ෂය වන විට වෙනස් වී ඇති බැවින් නව BSR මිල ගණන්වලට අනුව මෙම ඇස්තමේන්තුව නැවත රු.1808569.07 ක් වශයෙන් සංශෝධනය කරන ලද අතර වර්තමාන මිල ගණන් වලට අනුව මේ සඳහා අදාළ අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දෙන්නේනම් වෙන් කරන ලද මුදලට වඩා අමතරව වැය වෙන ලක්ෂ 20ක් නොඉක්මවන ලද මුදල් ප්‍රමාණය ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීමට හැකි බවට 2021.09.17 දින මහ සභා අනුමැතිය ලබා දී ඇති අතර මේ අනුව නව ඇස්තමේන්තුව 2021.10.04 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් මගින්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කළ අතර මෙතෙක් අදාල ඇස්තමේන්තුව වෙත අනුමැතිය ලැබී නොමැති අතර අද දින මහ සභාවට අදාල සභා න්‍යාය පත්‍රය ඔබ තමුන්නාන්සේලාට එවීමෙන් අනතුරුව එනම් 2021.12.08 යන දින පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී මහතා විසින් අප විසින් පෙර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව අනුව මෙම කර්මාන්තයේ වැඩ 2021.12.15 දිනට පෙර කඩිනමින් අවසන් කළ යුතු බවට දුරකථනයෙන් දැනුම් දී ඇති අතර නමුත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇති නව මිල ගණන් යටතේ සකස් කරන ලද ඇස්තමේන්තුව තිබියදී වාචික ප්‍රකාශයක් මත පමණක් මෙහි වැඩ ආරම්භ කිරීමත්, ඒ සඳහා ලබා දී ඇති කාල පරිච්ඡේදය තුළ මෙම කර්මාන්තයේ වැඩ ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම මත මෙම කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙනුත්, එසේම පළාත් පාලන අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද රු. ලක්ෂ 7 ක මුදල සඳහා සභාව සතු 49-5301 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීමටත් ,අත් කරත්ත 04 ක් අලුතින් මිල දී ගැනීම සඳහාත් යන

කාරණාවන් සම්බන්ධයෙන් මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙම කර්මාන්තය සඳහා වෙන් කරන ලද මුදලට කොන්ත්‍රාත්කරුවන් පවසන ආකාරයට හා ප්‍රායෝගිකව පවතින තත්වයන් යටතේ පවතින මිල ගණන් යටතේ මෙම කර්මාන්තයේ සියලු ඉදිකිරීම් කටයුතු සිදු කළ නොහැකි බැවින් එම ප්‍රතිපාදන මුදලට යටත්ව මෙම කර්මාන්තයේ අන්තර්ගත පොහොර ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා කොන්ක්‍රීට් ආස්තරයක් දැමීම යන කාර්යයන් පමණක් සිදු කිරීම සුදුසු බවත්, තවද අදාල අමාත්‍යාංශය වෙත මෙම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර අදාල බිල්පත් 2021.12.15 දිනට පෙර යොමු කළ යුතු වුවද පවතින තත්ත්වය තුළ එය එම දිනට විධිමත්ව සිදු කළ නොහැකි වන බැවින් ඒ බව අදාල අමාත්‍යාංශය වෙත දැනුම් දී 2021.12.31 දිනට බිල් පත් පියවිය හැකි වන පරිදි කටයුතු සලසා ගෙන කඩිනමින් මෙම ව්‍යාපෘතියේ කටයුතු විධිමත් ක්‍රියා පටිපාටියට අනුව ආරම්භ කර සුදුසු පරිදි විධිමත්ව අවසන් කර අදාළ බිල් පත් පියවීම සුදුසු බවටත් එම අමාත්‍යාංශය මගින්ම වෙන් කරන ලද රුපියල් ලක්ෂ 7ක මුදලට අංක 49-5301දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරිම හා අත් කරත්ත 4ක් මිලදී ගැනීම විධිමත්ව සිදු කිරිමටත් ගරු මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

II. මොනරාගල කහම්බාන ග්‍රාම සේවා වසමේ කලුගම්මමුල්ල රදාන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එය සභා අරමුදලින් පිළිසකර කර දීම සඳහා2021.10.15 දින මහ සභාවේ 05.06 යෝජනා අංක 01 යටතේ යෝජනා ස්ථිර වූ අතර ඇති වූ ගැටලුකාරී තත්ත්යටන් කිහිපයක් හේතුකොට ගෙන මේ දක්වා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් මෙම යෝජනාව වෙනුවට එම මුදල් යටතේ කහම්බාන පාසල් මාවත සංවර්ධනය කිරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

එහි ගැටලුවක් නොමැති බැවින් කලින් සභාවට ඉදිරිපත් කළ යෝජනාව වෙනුවට කහම්බාන පාසල් මාවත සංවර්ධනය කිරීමට ආයතනයේ කාර්මික නිලධාරී මහතෙකු යොදවා මෙම ස්ථානය පරීක්ෂා කර අදාල නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව අදාල සංවර්ධන කටයුත්ත සහා අරමුදල් යටතේ සිදු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 05.ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කිරීම.

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සහා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.11.01 දින සිට 2021.11.30 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06. කමිටු වාර්තා සලකා බැලීම

නැත

## 07. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සමඟම සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

## 8.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ගුණවර්ධන මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව තම කොට්ඨාශයේ වසම් වල ජනතාවගෙන් 90%ක් පමණ හේන් ගොවිතැන් කරමින් ජීවත් වන ජනතාව විසින් එම ප්‍රදේශයේ කලු දිය ඇල්ල අලිවැටෙන් ඔබ්බට වෙන්න විශාල වපසරියක ගොවිතැන් කටයුතු සිදු කරගෙන ගිය අතර දෙසැම්බර් 31 වන දින වන විට මෙම ඉඩම් වලින් ඉවත් වන ලෙස ගොවිජන සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ඔවුන්ට දැනුම් දී ඇති අතර මෙසේ එම ගොවිතැන් කටයුතු නවතා එම ඉඩම්වලින් ඈත් වීම ඔවුන්ගේ ජීවිත වලට දැඩි තර්ජනයක් එල්ල වන අතර, මෙසේ කැලෑ එළි කර ඉතා දුක් මහන්සි වී වගා කටයුතු සිදු කරන තුරු නිහඬව සිටි මෙම නිලධාරීන් පසුව ඔවුන්ට ඉවත් වීමට දැනුම් දීම මහත් අසාධාරන කටයුත්තක් වන අතර ගරු සභාපතිතුමන් මේ සඳහා මැදිහත් වී ප්‍රදේශයේ කෘෂිකර්ම රාජ්‍ය ගරු අමාත්‍යතුමන් සමඟ සාකච්ඡා කර මේ ජනතාවට ගොවිතැන් කටයුතු කරගෙන යාමට අඩුම තරමින් අක්කර 5 බැගින්වත් ඉඩම් කොටස් වෙන් කර දීමට කටයුතු සලසා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

II. ඒ වගේ ම පසුගිය දිනක වෙහෙරගල ප්‍රාථමික විදුහලට ගරු ආණ්ඩුකාර තුමන් ප්‍රමුඛ ගරු සභාපතිතුමන් ද පැමිණි අවස්ථාවට සමගාමීව එම විදුහල නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පරිසරයත්, එහි ක්‍රීඩා පිටියත් සභාවේ යන්ත්‍ර සූත්‍ර යොදා සකස් කර දීම සම්බන්ධව සියලුම දෙමාපියන් සහ ගම් වාසීන් වෙනුවෙන් ගෞරවනීය ස්තූතිය පුද කර සිටින බවට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

III. ඒ වගේ ම තමන් නියෝජනය කරන ග්‍රාම නිලධාරී වසම් හතරෙහි කිසිම අවස්ථාවක කපා සකස් කර නොමැති අතුරු මාර්ග ඇති අතර සති දෙකකට වැනි කාලයකට සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයත්, බැකෝලෝඩර් යන්ත්‍රයත් ලබා දීමෙන් එම අතුරු මාර්ග සියල්ලම කපා සකස් කර ගත හැකි බැවින් ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

IV. ඒ වගේම ගොවිජන සේවා නිලධාරීන් විසින් පසු ගිය දිනක අඹ පැල බෙදා දීමේ වැඩසටහනක් සිදු කර ඇති අතර ඒ සම්බන්ධව අපව දැනුවත් කර නොමැති අතර ප්‍රදේශවාසීන් අප ගැන වැරදි අවබෝධයකින් සිටින බව සඳහන් කරමින් 2022 නව වසරට සුභ ප්‍රාර්තනා ගෙන එමින් ගරු මන්ත්‍රීතුමා සියළු දෙනාටම ස්තුතිය පුද කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- මේ වන විට ඉඩම් අමාත්‍යතුමන් සමඟත් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන් සමඟත් මෙම ඉඩම් ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡාවන් පවත්වා ඇති බවත්, මෙම අලි වැට සීමාවෙන් එහාට කෙසේවත් ඉඩම් ලබා නොදෙන අතර කෙසේ වෙතත් යම් භූමි ප්‍රමාණයක් හෝ මේ ගොවි මහතුන් වෙනුවෙන් ලබා දීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ඒ වගේම ග්‍රාම නිලධාරී වසම් වලට අඹ පැළ බෙදා දීම සිදු කර ඇත්තේ ගොවිජන සේවා ආයතනය මගින් වන අතර ඒ සම්බන්ධයෙන් තමන් නිසි තොරතුරක් නොදන්නා බවත් ගරු සභාපතිතුමා සඳහන් කර සිටින ලදි.

## 8.2<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - උදේනි රම්‍යලතා මැතිතුමිය</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව සිරිවිජයපුර මෙහෙනි ආරාමේ මාර්ගය සකස් කිරීමට නියමිත බවට ප්‍රාදේශීය සභා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට ඇතුලත්ව තිබුණද මෙ වනවිට අක්කර 7 මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කර එයද මේ වන විට වැඩ නවතා ඇති බැවින්, ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත්, ඒ වගේම එම ප්‍රදේශයේ සුසාන භූමිය කැලෑවට යටවී ඇති බැවින්, ඒ සම්බන්ධවත් අවධානය යොමු කර අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමිය සඳහන් කරමින් සියලු දෙනාට ස්තූතිය ප්‍රකාශ කර සිටින ලදී.

**<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>**

- ලබන සතිය තුලදී සුසාන භූමිය සකස් කර දීමට කටයුතු සකස් කර දෙන බවත්, ඒ වගේම ප්‍රාදේශීය මාර්ග ව්‍යාපෘතියට සිරිවිජයපුර ආරාමේ මාර්ගය නමින් සංවර්ධන නාමය ලබා දී තිබූ අතර, මෙම ව්‍යාපෘතියට අදාළ මන්ත්‍රීතුමා අද දින සභාවට සහභාගී වී නොමැති නිසා මේ සම්බන්ධයෙන් කරුණු සොයා බැලිය යුතු බවත්, මාර්ග නාමය වෙනස් වී ඇත්නම් ඉදිරියේදී ලැබෙන ප්‍රතිපාදන වලින් හෝ එම මාර්ගය සංවර්ධනය කර දිය හැකි බවටද ගරු සභාපතිතුමා සඳහන් කරන ලදි.

## 8.3 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අතුල කුමාරසිරි මැතිතුමා</u>

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ඌව පළාත් හිටපු ආණ්ඩුකාරවරයෙකු වන රාජා කොල්ලුරේ මහතාගේ හදිසි අභාවය වෙනුවෙන් එම පවුලේ ඥාතීන් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ සියලු දෙනාගේම ශෝකය පල කර සිටින බවත්, ඒ වෙනුවෙන් ශෝක ප්‍රකාශයක් යවන ලෙසත්, ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී.

II. ඒ වගේම මදුරුකැටිය සොහොන් පිටිය සඳහා වෙන් කර ඇති සභාවට අයත් භූමියට කසල ගෙන ගොස් යොදා පිරවීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් කලබලයට පත් වී සිටි බවත්, නමුත් අද වන විට එම තත්ත්වය වෙනස් කර එය විධිමත්ව සකස් කර පැහැදිලි භූමියක් බවට පත් කර තිබීම සම්බන්ධවත් , ඒ වගේම මෙසේ සභාව මගින් විධිමත්ව සිදු කෙරෙන ඕනෑම ක්‍රියාදාමයක් වෙනුවෙන් ඕනෑම සහයෝගයක් ලබා දෙන බවට ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී.

III. හුලංදාව බිබිල පාරේ කළුගලයාය මාර්ගයට හැරෙන බුදු පිළිමය ඇති ස්ථානයේ ප්‍රධාන පාරට හරස් අතට වැඩී ඇති පොල් ගසක් පවතින අතර, එය දැඩි අනතුරුදායක තත්ත්වයක් පෙන්නුම් කරන බැවින්, වගකිව යුතු ආයතන දැනුවත් කර මෙය ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්, ඒ වගේම මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යටතේ ලක්ෂ 5ට අඩුවෙන් සිදු කරන කොන්ත්‍රාත් වලදී රෙඩිමික්ස් යන්ත්‍ර යොදා ගනිමින් කටයුතු කිරීම අපහසු හා ගැටළුකාරී තත්ත්වයක් ගෙන දෙන බැවින්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මේ සම්බන්ධව සාකච්ඡා කර විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර සිටින ලදී.

V. ගුණවර්ධන මන්ත්‍රීතුමා විසින් සභාවට ප්‍රකාශ කරන ලද ඉඩම් සම්බන්ධයේදී එදා මෙදා තුර විසඳුමක් නොමැතිව තවමත් පවතින මෙම කාරණාවේදී අලිවැට නියමාකාරයෙන් සීමා මායිම් සහිතව ඉදි කළ යුතු අතර, මෙහි සීමාවන් දැමීමේදී ප්‍රදේශයේ ගොවි ජනතාව සමගත්, අදාළ ආයතනත් සමග සාකච්ඡා කර කටයුතු කළ යුතු අතර, මෙම ගොවි ජනතාව වෙනුවෙන් ලබා දිය හැකි උපරිම ඉඩම් ප්‍රමාණය ලබා දීමට කටයුතු කළ යුතු අතර, අලිවැට නිර්මාණය කළ පසු ඉන් එහා ප්‍රදේශයට කිසිදු කෙනෙකුට ඇතුලත් විය නොහැකි ආකාරයේ තීරණයන් හා කොන්දේසි ගෙන ඒම කුමන රජයක් බලයේ සිටියත් සිදු කළ යුතු අතර, මෙහි ඉතිරි ඉඩම් ප්‍රමාණය ඉතාමත් සාධාරණව එම ගොවි ජනතාවට බෙදා දීමට කටයුතු කරන ලෙසට ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

VI. 2018 වර්ෂයේ සිට අද දක්වා ප්‍රාදේශීය සභාවේ ඔබ අප සියලු දෙනා සහයෝගයෙන් කටයුතු කළ ආකාරයෙන්ම ඉදිරි මාස කීපයද ඒ ආකාරයෙන්ම කටයුතු කරමු යන්නත් ප්‍රාදේශීය සභාවෙන් ගන්නා නිවැරදි තීන්දු තීරණ හමුවේ තම පක්ෂයේ සියලු දෙනාගෙන් උපරිම සහයෝගය ලබා දෙන බවත් ප්‍රකාශ කරමින් නව වසරට සුභ ප්‍රාර්ථනා ගෙන එමින් ගරු මන්ත්‍රිතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම</u>

- බිබිල පාරේ අනතුරුදායක පොල් ගස අදාළ ආයතනවලට දැනුම් දුන්නද කඩිනමින් ඉවත් කිරීමක් සිදු නොකරන නිසා සභා අරමුදල් මගින් එම ගස කපා ඉවත් කිරීමට කටයුතු කරන්නම් කියා ගරු සභාපතිතුමා සඳහන් කර සිටි අතර, මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට රෙඩිමික්ස් යන්ත්‍රය යොදා ගැනීම සම්බන්ධව මීට පෙරද අදාළ නිලධාරීන් සමග සාකච්ඡා කර ඇති අතර, ඉදිරියේදී මේ සඳහා විසඳුමක් ලබා ගත හැකි වනු ඇති බවත්, ඒ වගේම මේ වර්ෂය තුල අලිවැට ආශ්‍රිත ඉඩම් ප්‍රශ්ණය ගොවිජනතාවට විසඳා දීමට කටයුතු කරමු බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 8.4 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - චාමර නානායක්කාර මැතිතුමා</u>

ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව ඌව පළාත් හිටපු ගරු ආණ්ඩුකාර රාජා කොල්ලුරේ මැතිතුමාගේ හදිසි අභාවය සම්බන්ධව ප්‍රාදේශීය සභාව මගින් ශෝකය පල කර සිටින අතර, එතුමන්ගේ පවුලේ සියලු දෙනා වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ශෝකය පල කර ලිපියක් යැවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා සඳහන් කර සිටින ලදී. ඒ වගේම ලබන්නාවූ 2022 නව වර්ෂය ජනතාවගේ සියලු සිතුම් පැතුම් ඉටුවන සියලු වසංගත රෝග පීඩා දුරුවන සුභ නව වසරක් වේවායි සුභ පතමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- රාජා කොල්ලුරේ ගරු ආණ්ඩුකාරතුමාගේ අභාවය සම්බන්ධයෙන් පවුලේ ඥාතීන්ට ශෝකප්‍රකාශයක් යැවීමට කටයුතු කරමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 8.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුනිල් අරංගල මැතිතුමා

I. ගරු සභාවෙන් අවසර ගැනීමෙන් අනතුරුව 2021 වර්ෂය ගෙවී යන මේ මොහොතේ මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසම් 26 ම පොදු ජනතාව වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ මග පෙන්වීම යටතේ ඔබ අප සියලු දෙනාගේමත් සභාලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයේන් දුන් දායකත්වයත් සහ සහයෝගය නිසා විශේෂයෙන්ම ප්‍රාදේශිය සභාවට බදු ගෙවන ජනතාව විසින් ලබා දුන් සහයෝගය නිසා ප්‍රාදේශීය සභා කටයුතු ඉතා සාර්ථකව කර ගැනීමට හැකිවීම සම්බන්ධව සියලු දෙනාටම ගෞරවණීය ස්තූතිය පුද කර සිටින බවත්, ඒ වගේම ලබන්නා වූ 2022 වර්ෂය ඔබ අප සියලු දෙනාටත් සියලු ජනතාවටත් සුහම සුභ නිදුක් නීරෝගී නව වසරක් වේවායි සුභ ප්‍රාර්ථනා ගෙන එමින් ගරු මන්ත්‍රීතුමා සියලු දෙනාටම ස්තූතිය පුද කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දීම**

- මොනරාගල ප්‍රාදේශීය සභාවේ බුද්ධිමත් මන්ත්‍රී කණ්ඩායමක් සිටි නිසා අද වනතුරු ගැටුම්කාරී තත්ත්වයක් ඇති නොකර ගනිමින් පක්ෂ පාට භේදයකින් තොරව මේ තාක් සියලු කටයුතු සිදු කරගෙන පැමිණි අතර, ඒ සම්බන්ධයෙන් සතුටුවිය හැකි බවත් සහා කාලයෙන් පසුව වුවද අප හමුවන අවස්ථාවන් වලදී මුහුණ බලා සුහදව කතා කළ හැකි තැනට ඔබ අප සියලු දෙනාම කටයුතු කර ඇති බවත්, ඒ වගේම සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනා සභාවේ ගරුත්වය රැක දීමට උපරිම කැපවීමකින් කටයුතු කළ අතර, 2022 වර්ෂයේදී අපේ කාලය තිබෙනතුරු මේ ආකාරයෙන් සුහදව කටයුතු කරගෙන යන බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

මෙහිදී වෙනත් කරුණු කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ සියලු දෙනාගේම එකඟතාවය මත සභාවේ කටයුතු අවසන් කරන ලදි.

- ලබන මස සභා රැස්වීම 2022 වර්ෂයේ ජනවාරි මස 13 වන දින ප.ව.2.30 ට යොදා ගනිමු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර, ඒ සඳහා සභාවේ සියළු දෙනාම එකඟතාවය එල කර සිටින ලදී.

**ගරු සභාපතිතුමා**

සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.5.45.00 ට පමණ අවසන් කරන ලදී.

2021.12.10 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................ වන දින පැවැති මහ සභාවේ.......................................................................................................යෝජනාවෙන් සහ........................................................................................................ස්ථිරත්වයෙන්

ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................ වන දින පැවැති මහ සභාවේ..............................................................................................................යෝජනාවෙන් සහ..................................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරිමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරිම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරිම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරිම් නතර කිරිමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට

නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරිම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදි.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර

සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,

- **හදිසි යෝජනා ඉදිරිපත් කිරීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර තීරණ ගත යුතු හදිසි යෝජනා කිහිපයක් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට ගරු සභාපතිතුමා මහ සභාව වෙත ප්‍රකාශ කර ඒ සඳහා සභාවේ එකඟතාවය විමසා සිටින ලදි.

තවද න්‍යාය පත්‍රය සකස් කිරිමෙන් අනතුරුව අප වෙත ලැබුණු දැනුම් දීමකට අනුව මෙම ව්‍යාපෘතියට අදාල සංවර්ධන කටයුතු 2021 නොවැම්බර් මස 30 වන විට අවසන් කර බිල් පත් ඉදිරිපත් කළ යුතු බව දන්වා ඇති බැවින් මෙය හදිසි යෝජනාවක් ලෙස සභා අනුමැතියට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා මහ සභාවේ සියලු දෙනාගේ එකඟතාවය ලබා දීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පහත යෝජනාව ද මහ සභාවට ඉදිරිපත් කරන ලදි.

I. තවද මාර්ග අමාත්‍යාංශය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මිලියන 52ක් වෙන් කර ඇති අතර එම ප්‍රතිපාදන මගින් මාර්ග 49ක් සංවර්ධනය කළ යුතුව ඇත.මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙන්ම මඩුල්ල, සියඹලාණ්ඩුව, බුත්තල යන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ද මෙම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරිමේදි රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදිය යුතු බවට දන්වා ඇති අතර මෙම බල ප්‍රදේශ 4ටම රෙඩි මික්ස් සපයන ආයතන ඇත්තේ දෙකක් පමණක් බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටි අතර මෙම ආයතන දෙක මගින් මෙම මාර්ග සියල්ලටම රෙඩි මික්ස් සැපයීය යුතු අතර 2021 නොවැම්බර් මසට 30 දිනට පෙර අදාල මාර්ග වල ඉදිකිරීම් අවසන් කර මාර්ග අමාත්‍යාංශය වෙත බිල් පත් ඉදිරිලත් කළ යුතුව ඇත. එබැවින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවලට අයත් සංවර්ධනය කෙරෙන මාර්ග වැඩි ප්‍රමාණයක් පටු බව සහ බෑවුම් සහිත වීම නිසා රෙඩිමික්ස් ප්‍රවාහනයට අපහසු තත්ත්වයක් පවතින අතර කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍රය යොදවාගෙන මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇති පරිදි අදාල උපදේ හා කොන්දේසි වලට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට අනුව මෙම ව්‍යාපෘතිවල කටයුතු අදාල දිනට පෙර සිදු කිරීම සුදුසු බවටත්, කුඩා කොන්ක්‍රීට් මික්චර් යන්ත්‍ර යොදවාගනිමින් මෙම මාර්ග කොන්ක්‍රීට් කිරීමට පියවර ගැනීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.